OL/2014/14/S-I, II

18411

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **කතෝලික ධර්මය** | **I, II** | **පැය තුනයි** |
| கத்தோலிக்கத் திருமறை | **I, II** | மூன்று மணித்தியாலம் |
| Catholicism | **I, II** | *Three hours* |

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. භෞතික ලෝකයේ තිබෙන දුර්වලතා සහ ශක්තීන් මිනිසා තුළ තිබෙන්නේ ඔහු,
   (1) පොළොවේ දූවිල්ලෙන් මවා ඇති නිසා ය. (2) පරිණාමය වන නිසා ය.
   (3) මැරෙනසුලු නිසා ය. (4) ආදම් සහ ඒවගෙන් පැවත එන නිසා ය.

2. දිවැසිවරුන් කැඳවීමේ දී ඔවුන් ඒ සඳහා නුසුදුසු වුව ද දෙවියන් වහන්සේගේ කැඳවීම ප්‍රබල බව කියැවෙන්නේ
   (1) දානියෙල් කැඳවීමේ සිද්ධියෙනි. (2) මීකා කැඳවීමේ සිද්ධියෙනි.
   (3) ආමොස් කැඳවීමේ සිද්ධියෙනි. (4) යෙසායා කැඳවීමේ සිද්ධියෙනි.

3. හෙබ්‍රෙව් 1 : 1–2 අනුව දෙවියන් වහන්සේ ගැලවීමේ ඉතිහාසයේ දී අවසාන ලෙස අපට කථා කළේ
   (1) ආදි පීතෘවරුන් මගිනි. (2) සිය පුත්‍රයාණන් මගිනි. (3) රජවරුන් මගිනි. (4) දිවැසිවරුන් මගිනි.

4. "ඔබ සුවවීමට කැමති දැ" යි ජේසුස් වහන්සේ ඇසුවේ,
   (1) බෙතෙස්දා පොකුණ අසළ සිටි රෝගියාගෙනි. (2) අංශභාග රෝගියාගෙනි.
   (3) යක්ෂාවේශ වූ පුද්ගලයාගෙනි. (4) අත පණ නැති මිනිසාගෙනි.

5. "මට ගෙයක් දෙන්න, මැරෙන්න වැටිල ඉන්න අනාථ අයව මං බලා ගන්නම්." යැයි තම ප්‍රදේශ නායකයින්ගෙන් ඉල්ලා සිටියේ,
   (1) ශුද්ධ වූ වින්සන් ද පාවුලා මුනිතුමා ය. (2) භාග්‍යවත් තෙරේසා මව්තුමිය ය.
   (3) භාග්‍යවත් ජුසේ වාස් පියතුමා ය. (4) ශුද්ධ වූ අසීසියේ ෆ්‍රැන්සිස් මුනිතුමා ය.

6. මුල් කාලයේ සිට ම කොමියුනිස්ට් හා ද්‍රව්‍යවාදයට විරුද්ධව කටයුතු කළේ,
   (1) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමා ය. (2) ශුද්ධ වූ II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
   (3) ශුද්ධ වූ XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය. (4) ජේසුගේ කුඩා මල වන ශුද්ධ වූ තෙරේසා මුනිතුමිය ය.

7. ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමා 'මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව' නමැති සංවිධානය ආරම්භ කළේ,
   (1) දේව මාතා භක්තිය ව්‍යාප්ත කිරීමට ය.
   (2) ජර්මන් නට්සිවාදීන්ට මරියතුමියගේ බලවන්ත බව පෙන්වීමට ය.
   (3) යාච්ඤාව හා පශ්චත්තාපී ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමට ය.
   (4) සත්‍යය හා යුක්තිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සාක්ෂි දැරීමට ය.

8. "……… අද මට ඔබේ නිවසේ නවාතැන් ගන්න ඕනෑ" යැයි ජේසුස් වහන්සේ වදාළේ
   (1) මතෙව්ට ය. (2) පේදුරුට ය. (3) සකේවුස්ට ය. (4) ශතාධිපතියාට ය.

9. ගෝලයින්ගේ පාද දෝවනයෙන් පසු ජේසුස් වහන්සේ දුන් ආඥාව කුමක් ද?
   (1) "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න."
   (2) "ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න."
   (3) "ඔබ සැම මෙයින් ගෙන අනුභව කරන්න."
   (4) "මනස්ථාපනය වී සුබ අස්න අනුව ජීවත්වන්න."

10. "ඔබ ගොස් සිලෝවම් පොකුණෙන් සෝදා ගන්න" යැයි ජේසුස් වහන්සේ වදාළේ,
   (1) ජෙරිකෝවේ අන්ධයකුට ය. (2) පාර අද්දර හිඳගෙන උන් අන්ධයන් දෙදෙනාට ය.
   (3) අන්ධ බර්තිමේයස්ට ය. (4) ජාත්‍යන්ධයාට ය.

[දෙවෙනි පිටුව බලන්න

- අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට යෝග්‍ය වචනය තෝරන්න.

11. මිනිසා ශ්‍රේෂ්ඨතම මැවිල්ල නිසා අනෙකුත් සියලු ම මැවිලි ඔහු ...................... කරයි.
(1) සංවර්ධනය (2) ආරක්ෂා (3) සම්පූර්ණ (4) පාලනය

12. ස්නාවක ජොහන්තුමා වතුරෙන් බෞතිස්මය දුන් බව ප්‍රකාශ කරන ජේසුස් වහන්සේ අනාගතයේ දී ...................... බෞතිස්ම ස්නාපනය ලබා දෙන බව ප්‍රකාශ කරයි.
(1) ශුද්ධාත්මයාණන්ගෙන් (2) පූජාප්‍රසාදීන් වහන්සේගෙන්
(3) සභා මූලිකයාගෙන් (4) තේවාචාරීතුමාගෙන්

13. ශුද්ධ වූ මතෙව් ශුභාරංචියට අනුව "ඔබ යාච්ඤා කරන කල ...................... කළාක් මෙන් නොකරන්නැ"යි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක.
(1) පූජකවරු (2) ජනතාව (3) ලේකම්වරු (4) කෛරාටිකයන්

14. විද්‍යාව වනාහී දෙවිඳුන් දුන් ...................... සිදු කළ මිනිස් සොයා ගැනීම් සමුදායකි.
(1) සාමයෙන් (2) කරුණාවෙන් (3) හදවතින් (4) බුද්ධියෙන්

15. නිල පූජකවරය දානය කරනු ලබන්නේ අපේක්ෂකයාගේ ...................... මත අත් තබා යාච්ඤා කිරීමෙනි.
(1) උරහිස (2) ළය (3) හිස (4) නළල

16. ජාකොබ්ගේ ළිඳ ළඟ දී ජේසුස් වහන්සේ සමාරිය ස්ත්‍රියට තමන් හඳුන්වා දුන්නේ
(1) ජුදා නායකයකු ලෙස ය. (2) දිවැසිවරයකු ලෙස ය.
(3) ශ්‍රේෂ්ඨ ආචාර්යවරයකු ලෙස ය. (4) මෙසියස් ලෙස ය.

17. කතෝලික සභාවේ ධර්මෝපදේශයට අනුව සදාතන ජීවිතය ලබා ගැනීමට නම්,
(1) යහපත් දිවි පෙවෙතක් ගත කළ යුතු ය. (2) පනත් අනුසාර කළ යුතු ය.
(3) ඥානගෝපාලයන්ට දහයෙන් පංගුව දිය යුතු ය. (4) දිනපතා ජපමාලය උච්චාරණය කළ යුතු ය.

18. උසස් ලෙස මවන ලද මිනිසා පිළිසිඳ ගැනීමේ සිට මරණය දක්වා ජීවත් විය යුත්තේ
(1) ප්‍රසන්න ලෙස ය. (2) ශුද්ධවන්ත ලෙස ය. (3) දිළිඳු ලෙස ය. (4) ස්වාධීන ලෙස ය.

19. දෙවි සමිඳුන් අදහන ක්‍රිස්තු භක්තිකයාගේ ඇදහිල්ලේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) විනිශ්චය කිරීමයි. (2) රෝගීන් බැහැදැකීමයි. (3) යාච්ඤා කිරීමයි. (4) ගීතිකා ගැයීමයි.

20. දෙවියන් වහන්සේ තමන් හට අයදින අයට යුක්තිය ඉටු කර දෙන බව ඉගැන්වෙන උපමාව කුමක් ද?
(1) පරිසිවරයා සහ අයකැමියා (2) වංචනික ගබඩාකාරයා
(3) වැන්දඹුව සහ විනිශ්චයකාරයා (4) බීජ වපුරන්නා

21. අප පොදු පූජකවරයේ පංගුකාරයන් ලෙස ප්‍රථමයෙන් අභිෂේක ලබන්නේ,
(1) අභිවෘද්ධි ආලේපය මගිනි. (2) ප්‍රසාද ස්නාපනය මගිනි.
(3) පූජාත්වරය මගිනි. (4) දිව්‍ය සත්ප්‍රසාදය මගිනි.

22. සකරියස්ගේ උදාන ගීය සහ මරියතුමියගේ උදාන ගීය අඩංගු යැදුම කුමක් ද?
(1) ශුද්ධ වූ පැය (2) ශුද්ධ වූ ජපමාලය (3) විශ්වාසිකයින්ගේ යැදුම (4) යාම යැදුම

23. ස්වාමිවාක් ආරාධනාව අඩංගු සුභාරංචි යුගළය වන්නේ
(1) ශුද්ධ වූ මාර්ක් සහ ශුද්ධ වූ මතෙව් ය. (2) ශුද්ධ වූ මතෙව් සහ ශුද්ධ වූ ලූක් ය.
(3) ශුද්ධ වූ මාර්ක් සහ ශුද්ධ වූ ජොහන් ය. (4) ශුද්ධ වූ ජොහන් සහ ශුද්ධ වූ ලූක් ය.

24. "මම වනාහි ස්වයම්භූ නම් තැනැත් වහන්සේ වෙමි." යැයි දෙවියන් වහන්සේ වදාළේ,
(1) ආබ්‍රහම්ට ය. (2) මෝසෙස්ට ය. (3) ජාකොබ්ට ය. (4) ඊසාක්ට ය.

25. ජේසුස් වහන්සේ අන්‍යාරූප විලාසය සිදු වන විට ළඟ සිටි අපෝස්තුළුවරුන් වන්නේ,
(1) ජාකොබ්, පේදුරු හා සීමොන් ය. (2) පේදුරු, එලියා හා ජූදස් ය.
(3) අන්දරේ, පේදුරු හා ජොහන් ය. (4) පේදුරු, ජොහන් හා ජාකොබ් ය.

26. ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට හා උත්ථානයට අප ඒකාබද්ධ වන්නේ
(1) ප්‍රසාද ස්නාපනය මගිනි. (2) අභිවෘද්ධි ආලේපය මගිනි.
(3) දිව්‍ය සත්ප්‍රසාදය මගිනි. (4) රෝගීන්ගේ ආලේපය මගිනි.

27. "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. උන්වහන්සේ මා ආලේප කළ සේක." ක්‍රිස්තුන් වහන්සේ මෙම වදන් ඇතුළත් ග්‍රන්ථය කියවූයේ
(1) කන්ද උඩ දේශනයේ දී ය. (2) ජෙරුසලමේ දේව මාලිගයේ දී ය.
(3) නාසරෙත්හි ධර්මශාලාවේ දී ය. (4) එම්මාවුස්හි දී ය.

[තුන්වෙනි පිටුව බලන්න

28. අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය ලැබීමෙන්
A – ජීවිතය පූර්ණත්වයට පත් වේ.
B – ජන්ම පාපයෙන් නිදොස් වේ.
C – වචනයෙන් හා ක්‍රියාවෙන් විශ්වාසවන්තව සාක්ෂි දැරීමට හැකි වේ.
D – ශුද්ධ වූ සභාව සමඟ ඇති සම්බන්ධතාව තහවුරු වේ.
ඉහත ප්‍රකාශය හා ගැළපෙන නිවැරදි කරුණු දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, D (3) A, C, D (4) B, C, D

29. නිශ්චිත අරමුණක් ඇතිව අපගේ කිතුනු ජීවිත ගොඩනැඟීමට,
(1) දිව්‍ය භෝජනයෙන් පෝෂණය විය යුතු ය. (2) දේව වචනයට සවන් දිය යුතු ය.
(3) ශාරීරික සුවය ඇති කර ගත යුතු ය. (4) ආත්මික සුවය ඇති කර ගත යුතු ය.

30. පෙන්තකොස්ත දිනය උදා වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ජයග්‍රාහී උත්ථානයෙන් දින,
(1) තුනකට පසුව ය. (2) දහයකට පසුව ය.
(3) හතළිහකට පසුව ය. (4) පනහකට පසුව ය.

31. කතෝලික විවාහ පොරොන්දුවෙන් උපුටා ගත් වගන්ති කිහිපයක් පහත දැක්වේ.
A – වාසනාවත් කල් හි ද, අවාසනාවත් කල් හි ද,
B – මම ඔබට විශ්වාසවන්ත වන්නට
C – මාගේ මුලු ජීවිත කාලය තුළ දී ම
D – මම ඔබට ගෞරව කරන්නට
ඉහත සඳහන් වගන්ති අතුරෙන් විවාහ පොරොන්දු, කොන්දේසි විරහිත බව දැක්වෙන වගන්තිය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

32. පැවිදිවරුනට පැවරෙන ප්‍රධාන වගකීමක් වන්නේ,
(1) තමාව පමණක් ශුද්ධවන්ත කරවීම ය. (2) සමාජ සේවයට මුල් තැන දීම ය.
(3) අන් අය ද ශුද්ධවන්තභාවය කරා ගෙන යාම ය. (4) ධර්ම විවේක පැවැත්වීම ය.

33. ශුද්ධ වූ සභාව යනු,
(1) පැවිදිවරුන්ගේ එකතුවකි. (2) දේව ජනතාවගේ සමාජයකි.
(3) ගිහියන්ගේ එකතුවකි. (4) ශුද්ධවන්ත සමාගමකි.

34. ක්‍රිස්තුන් වහන්සේ තම දූත කාර්යය සඳහා ශ්‍රාවකයන් තෝරා ගැනීමෙන් පිළිබිඹු වන ලක්ෂණයක් වන්නේ,
(1) ගිහි දායකත්වයයි. (2) පැවිදි නායකත්වයයි.
(3) දූත කාර්ය විමධ්‍යගත කිරීමයි. (4) මිත්‍රත්වය ගොඩනැංවීමයි.

35. සමාජ විද්‍යාවට අනුව පොදු අවශ්‍යතා රැසක් ඉටු කරන සමාජ සංස්ථාව වන්නේ
(1) පවුල ය. (2) පාසල ය. (3) කිතුනු සංසය ය. (4) ක්‍රීඩා සමාජය ය.

36. ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටිය දී ස්වර්ගය විවර වී, ශුද්ධාත්මයාණන් වහන්සේ පරෙවියෙකුගේ රූපාකාරයෙන් පහළ වීම,
(1) ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයකි. (2) ශුද්ධාත්ම ආගමනයකි.
(3) දේව අනාවරණය වීමකි. (4) පිරිසිදු වීමකි.

37. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ප්‍රථමයෙන් ම
(1) දිව්‍ය පූජාවට සහභාගී විය යුතු ය. (2) ජපමාලය භාවනා කළ යුතු ය.
(3) දිළිඳුනට උපකාර කළ යුතු ය. (4) පවුලේ අයට ආහාර සූදානම් කළ යුතු ය.

38. දෙවියන් වහන්සේගේ පණිවිඩය ජනතාව වෙත ගෙන ආ දිවැසිවරු බොහෝවිට ජනතාව විසින්,
(1) ප්‍රතික්ෂේප කරන ලදී. (2) දිරිමත් කරන ලදී.
(3) නායකයන් වශයෙන් පත් කරන ලදී. (4) විශ්වාස කරන ලදී.

39. දේශීය භාෂාවලින් දිව්‍ය පූජාව සිදු කරනු ලබන්නේ
(1) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව ය. (2) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව ය.
(3) නිසියාන මන්ත්‍රණ සභාවෙන් පසුව ය. (4) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් පසුව ය.

40. 'අල්ෆා' හා 'ඔමේගා' යන වචනවල දේව ධාර්මික අර්ථය නම්
(1) ක්‍රිස්තුන් වහන්සේ මරණය සහ උත්ථානය බව ය.
(2) ක්‍රිස්තුන් වහන්සේ කරුණාවේ සහ දයාවේ උල්පත බව ය.
(3) ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහණය සහ නැවත පැමිණෙන බව ය.
(4) ක්‍රිස්තුන් වහන්සේ ආරම්භය සහ අවසානය බව ය.

* *

[හතරවෙනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබ අභිවෘද්ධි ආලේපය ලැබූ දේව මෙහෙයේ සිදු වූ දෑ **දෙකක්** සඳහන් කරන්න.
(ii) ශුද්ධ වූ II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා විසින් භාග්‍යවරයට ඔසවනු ලැබූ ඉන්දියාවට සම්බන්ධ **දෙදෙනෙකු** නම් කරන්න.
(iii) පෙන්තකොස්ත දිනයේ සිදු වූ සිදුවීම් **දෙකක්** ලියන්න.
(iv) මැවුම්කාර දෙවිඳුන්ට යාච්ඤා කිරීමට ඇති ක්‍රම දෙක මොනවා ද?
(v) පූජකවරුන් තුළ තිබිය යුතු ලක්ෂණ **දෙකක්** පෙන්වා දෙන්න.
(vi) ශුද්ධ බයිබලය තුළ දේව අනාවරණය සිදු වී ඇති විවිධ පුද්ගල කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.
(vii) ශ්‍රී ලංකා සභා සංස්කෘතිය දේශානුරූපීකරණය සඳහා උර දුන් පුද්ගලයින් **දෙදෙනෙකු** නම් කරන්න.
(viii) ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළින් බිහි වූ දේශීය පැවිදි නිකායන් **දෙකක්** ලියන්න.
(ix) ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු මණ්ඩලය විසින් අනුමත කර ඇති ණය මංගල්‍ය දින **දෙකක්** සඳහන් කරන්න.
(x) "ආසියාව ලෝකයේ ප්‍රධාන ආගම්වල තොටිල්ල වේ." මෙම උපුටනය සනාථ කෙරෙන ප්‍රධාන ආගම් **දෙකක්** දක්වන්න.

(ලකුණු 2 × 10 = 20යි)

**2.** (i) භාග්‍යවත් ජුසේවාස් පියතුමා ඉන්දියාවේ ජීවත් වූයේ කුමන නගරයේ කුමන ග්‍රාමයක ද?
(ii) භාග්‍යවත් ජුසේවාස් පියතුමා මෙරට සේවය කළ ප්‍රදේශ **තුනක්** සඳහන් කරන්න.
(iii) රෝගීනට උපස්ථාන කිරීම පිළිබඳ භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ ජීවිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ **පහක්** පෙන්වා දෙන්න.

(ලකුණු 10යි)

**3.** (i) ජේසුස් වහන්සේ තම උත්තම පූජක යාච්ඤාව තුළින් කළ ඉල්ලීම් **දෙකක්** සඳහන් කරන්න.
(ii) දිනපතා යාච්ඤා කිරීමට යොදා ගත හැකි අවස්ථා **තුනක්** දක්වන්න.
(iii) යාච්ඤා කිරීමේ අවශ්‍යතාව සහ වැදගත්කම කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 10යි)

**4.** (i) ක්‍රියා පොතේ සඳහන් මුල් කිතුනු සංසය තුළ තිබුණු විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.
(ii) අන් අය වෙනුවෙන් පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කිරීමට දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගි වීමෙන් කළ හැකි ක්‍රියා **තුනක්** සඳහන් කරන්න.
(iii) දිව්‍ය පූජාවට සහභාගී වීමට මැළි වන ඔබේ මිතුරෙකුට / මිතුරියකට එහි වැදගත්කම කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

**5.** (i) මිනිස් ජීවිතයේ පාරිශුද්ධත්වය සිහිගන්වන දේව පනත් **දෙකක්** ලියන්න.
(ii) ශාරීරික හා ආධ්‍යාත්මික පිරිසිදුකමට එරෙහිව මුහුණපාන පරීක්ෂා **තුනක්** සඳහන් කරන්න.
(iii) ශුද්ධවන්ත ජීවිතයක් ගතකිරීමට ඔබට කළ හැකි ක්‍රියා **පහක්** විස්තර කරන්න.

(ලකුණු 10යි)

**6.** (i) දේව රාජ්‍යයේ අයිතිය ගැන කියැවෙන පළමු සහ අටවන භාග්‍ය **දෙක** නම් කරන්න.
(ii) 'බැගෑ සිතින්' යන්න කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.
(iii) භාග්‍යයන් අනුව ජීවත් වීමේ අවශ්‍යතාව කරුණු **පහකින්** විස්තර කරන්න.

(ලකුණු 10යි)

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා
(ii) "පියවරුනි, ඔබේ දරුවන් කෝප නොකරන්න." (එපීස 6 : 4)
(iii) විශ්වාසයේ පියා වූ ආබ්‍රහම්තුමා
(iv) නූතන ලෝකය තුළ කිතුනු විවාහය
(v) දෙවිඳුන්ගේ දාසිය වූ මරියතුමිය

(ලකුණු 5 × 2 = 10යි)

***